ශ්‍රී ලාංකික පුද්ගලයෙකු වියට්නාමයේ සරණාගත කඳවුරක දී දිවි තොර කර ගැනීම ඔස්සේ මරණයට පත් වූ බව මාධ්‍ය වාර්තා කර තිබුණි. ඔහුගේ දේහය බිරිඳ විසින් ඉල්ලා සිටීම පිළිබඳ පුවත, මව්බිම සහ අද පුවත්පත් ( දෙසැම්බර් 01, 2022) වාර්තා කර තිබිණි.

* අද පුවත එම තැනැත්තාගේ දරුවන්ගේ ඡායාරූප පළ කර නොතිබුණි.

* නමුත් මව්බිම පුවත එම තැනැත්තාගේ දරුවන්ගේ ඡායාරූප පළ කර තිබුණි.

* පුවත් දෙක සමඟම හදිසි උපකාරක අංක පළ වී නොතිබුණි.

1) බාල වයස් දරුවන්ගේ ඡායාරූප පළ කිරීම, ඔවුන්ගේ පාසල් අධ්‍යාපනයට ගැටලු ඇති නොකරන්නේ යැයි සහතික වීමට හැකිද?

2) දිවි තොර කර ගැනීමක් සම්බන්ධ වන පුවතක් සමඟින් හදිසි උපකාරක අංක ද සඳහන් කිරීම ඔස්සේ, දිවි තොර කර ගැනීමට නැඹුරුවක් ඇති තවත් අයෙකුගේ ජීවිතය බේරා ගැනීමට උපකාරයක් නොලැබෙනු ඇතිද?

උපකාරක අංකයක් සඳහන් කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න